Article 11

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date } 19th July 2021. |

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | ජ්.එල්. වික්‍රම මයා.<br>අංක : 341/6, ශ්‍රී සෝමරත්න මාවත,<br>වටරැක, පානදුර. |
| වගඋත්තර පාර්ශවය | : | ප්‍ර.පො.ප. බිමල් පෙරේරා මයා,<br>පොලිස් ස්ථානය,<br>කිරුළපන. |
| <u>පැමිණිලි අංකය</u> | <u>:</u> | <u>**HRC/4437/15**</u> |

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2015.12.06 වන දින රාත්‍රී 11.00 ට පමණ තමා තම සහෝදරයා සහ මස්සිනා සමග නිවසට පැමිණෙමින් සිටියදී පොලිස් නිලධාරින් දෙදෙනෙකු විසින් තමාට මාංචු දමා තිදෙනාවම පොලිස් ස්ථානයට රැගෙන ගොස් සිර මැදිරියට දමන ලද බවයි. පසු දින එනම්, 2015.02.07 වන දින උදේ 6.30 ට පමණ ස්ථානාධිපතිවරයාගේ කාමරය වෙත ගෙන ගොස් ස්ථානාධිපති බිමල් පෙරේරා මහතා විසින් තමාට පහරදී වම් කනට තුවාල සිදුකළ බවත් සඳහන් කර ඇත. එසේම තමා 2015.12.08 වන දින හෝමාගම රෝහලට ඇතුළු වී ප්‍රතිකාර ලබාගෙන 2015.12.12 වන දින රෝහලෙන් පිටව ගිය බවත් පැමිණිල්ලෙන් සඳහන් කර සිටි.

පැමිණිලිකරු පැමිණිල්ල තහවුරු කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් ද ඉදිරිපත් කර ඇති අතර, එම දිවුරුම් ප්‍රකාශයේද සඳහන් වන්නේ ද පැමිණිලිකරුව පොලිසියට රැගෙන ගොස් පසුදා උදෑසන 6.00 ට පමණ ස්ථානාධිපතිවරයා කාමරයට රැගෙන ගොස් වම් කනට තුවාල වන ලෙස පහරදුන් බවයි.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் } sechrc@gmail.com

පැමිණිල්ලේ සාක්ෂි වශයෙන් අජිත් සේනානන්ද ලාල් වික්‍රම යන අය විසින් මේ සම්බන්ධයෙන් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති අතර, එම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් වන්නේ 2015.12.06 වන දින තමා සේවය කරන ගොඩගම සබ්මැරීන් හෝටලයේදී තමා හමුවීමට පැමිණි තම මස්සිනා වන මහින්ද වීරබද්දන යන අය සමග තම අයියා වන ආනන්ද ලාල් වික්‍රම යන අයද සමග ඔහුට අයත් 24425 දරණ ත්‍රිරෝද රථයෙන් වටරැක හන්දියට පැමිණ එම ස්ථානයේ තිබූ වෙළඳ සැලක් අසල රථය නතර කර භාණ්ඩ වගයක් මිලදී ගැනීමට යන අවස්ථාවේදී පාදුක්ක පොලිස් ස්ථානයේ යතුරු පැදියක් එම ස්ථානයට පැමිණ පරුෂ වචනයෙන් බැණ වැදී තම අයියා වන ආනන්ද වික්‍රම යන අයගේ දෑතට මාංචු දමා තිදෙනාම පොලිස් ස්ථානයට රැගෙන ගිය අතර, එහිදී ද පහරදී තිදෙනාම පොලිස් සිර මැදිරියට දැමූ බවයි. පසුදින උදෑසන ස්ථානාධිපතිවරයා පැමිණ තමාටත්, තම අයියාටත්, මස්සිනාටත් අමානුෂික අන්දමින් පහරදුන් බවත්, පසුව නැවත සිර මැදිරියට දැමූ බවත්, අයියා කණ අල්ලාගෙන වේදනාවෙන් කෙඳිරි ගෑ බවත්, එම අවස්ථාවේදී පරීක්ෂා කර බලනවිට අයියාගේ කණෙන් ලේ එනවා දුටු බවත්, පසුව තිදෙනාම අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසුව අධිකරණයෙන් ඇප ලබා 2015.12.07 වන දින හෝමාගම රෝහලට ඇතුළු වී ප්‍රතිකාර ලබාගත් බවත් සඳහන් කර ඇත.

පැමිණිල්ලට අදාලව මහින්ද වීරබද්දන යන අය විසින් දිවරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, 2015.12.06 වන දින පාදුක්ක පොලිසියේ නිලධාරින් විසින් තමාවත්, අජිත් සේනානන්ද ලාල් වික්‍රම සහ ආනන්ද ලාල් වික්‍රම යන අයවත් අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට රැගෙන ගොස් පොලිස් සිර මැදිරියට දමන ලද බවයි. පසුදින උදෑසන 6.00 ට පමණ ස්ථානාධිපතිවරයා විසින් ඔවුන් තිදෙනාටම පහරදුන් බවත්, පසුව ආනන්ද ලාල් වික්‍රම යන අය කණ අල්ලාගෙන කෙඳිරිගාන විට එය පරීක්ෂා කිරීමේදී කණෙන් ලේ ගලනු දුටු බවත්, පසුව අධිකරණයට ඉදිරිපත් කර ඇප මත නිදහස් වූ පසු හෝමාගම රෝහලට ගොස් ආනන්ද ලාල් වික්‍රම යන අය ප්‍රතිකාර ලබාගත් බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකාර ආනන්ද ලාල් වික්‍රම යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව කොමිෂන් සභාව වෙත කැඳවා ඇති අතර, එම වාර්තාවට අනුව රෝගියා විසින් ලබා දෙනු ලබන රෝග ඉතිහාසයේ සඳහන් කර ඇත්තේ, ‘2015.12.06 වන දින රාත්‍රි 11.30 ට පමණ පාදුක්ක පොලිසියෙන් මාංචු දමා අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත්, 2015.12.07 වන දින උදෑසන 6.00 ට පමණ පාදුක්ක පොලිසියේ ස්ථානාධිපති පෙරේරා නැමති අය ඔහුගේ කාමරයේ දී මුහුණට සහ ඔළුවට පහරදුන් බවයි.’ අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව බරපතල නොවන තුවාල දෙකක් ඇති බවට සඳහන් වන අතර, දකුණු අතේ මැණික් කටුව අසල තුවාලයක් ද, වම් කණ තුවාල වී ඇති බවත් සඳහන් වේ.

අධිකරණ වෛද්‍ය නිලධාරියා රෝගියාගේ කෙටි ඉතිහාසය සහ තුවාල සැසඳෙන බවද දක්වා ඇත.

**වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-**

වගඋත්තරකාර ප්‍ර.පො.ප බිමල් පෙරේරා මහතා විසින් කරුණු ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, 2015.12.07 වන දින පැය 12.40 ට 119 යතුරු පැදියේ රාජකාරියේ නිරත වූ පො.කො. 27571 අසිත සහ සිවිල් ආරක්ෂක නිලධාරි 84671 ගයාත් නිලධාරියා සිය රාජකාරියේ යෙදී සිටියදී පාදුක්ක සෝමරත්න මාවතේදී අංක : 24427 දරණ ත්‍රිරෝද රථය පරීක්ෂා කිරීමේදී එම ත්‍රිරෝද රථය පදවමින් සිටි අංක : 344/6, වටරුක, පාදුක්ක ලිපිනයේ පදිංචි ආනන්ද ලාල් යන අය බීමත්ව සිටි බවට ගඳ වහනය වූ බැවින් බීමත්ව රිය පැදවීමේ වරද කියාදී පො.කො. අසිත නිලධාරියා විසින් මෙම අයව අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඊට ප්‍රතිරෝධය පාමින් ඒ අය සමග පැමිණි තවත් දෙදෙනෙක් වන මහින්ද වීරබද්දන සහ අජිත් ලාල්වික්‍රම යන අය පොලිස් නිලධාරින් හට බලහත්කාරය පාමින් අත්අඩංගුවට ගැනීමට ප්‍රතිවිරෝධය දැක්වීම හේතුවෙන් රාත්‍රි මුර සංචාරයේ යෙදී සිටි නිලධාරින් ගෙන්වා එම අයගේ ආධාරය මත මෙම අයව පොලිස් ස්ථානයට රැගෙන ආ බවයි. එසේම අධිකරණ වෛද්‍ය පෝරම 981 සහ 982 යටතේ පාදුක්ක රෝහලේ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කළ අතර, ආනන්ද ලාල් වික්‍රම යන අය බීමත්ව රිය පැදවීමේ වරදට ද, මහින්ද වීරබද්දන සහ අජිත් ලාල් වික්‍රම යන අය බීමත්ව අශෝබන ලෙස හැසිරීම යන වරද යටතේ සහ රජයේ නිලධාරින්ට සාපරාධී බලහත්කාරය පෑම යන වගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණය වෙත බී 9476/15 යටතේ ඉදිරිපත් කළ අතර, මෙම තිදෙනාට විරුද්ධව මේවනවිට චෝදනා පත්‍ර ගොනු කර ඇති බවද සඳහන් කර ඇත. මෙම අය අත්අඩංගුවට ගැනීමේදී අවම බලය පාවිච්චි කළ බවට නිලධාරින් සටහන් කර ඇති බවත් දක්වා ඇත.

තවද, පහරදීම සම්බන්ධයෙන් කරන චෝදනා සම්බන්ධයෙන් වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ, අත්අඩංගුවට ගැනීම තමා විසින් සිදුනොකළ බවත්, පසුදින උදැසන තමා ස්ථානයට පැමිණි අවස්ථාවේදී මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් අසිත යන නිලධාරියා විසින් දැනුම්දීම කළ බවත්, පොලිස් ස්ථානාධිපතිවරයාට ඇප දිය හැකි වැරදි වලට අමතරව පොලිස් නිලධාරියෙකුට සාපරාධී බලහත්කාරය පෑම යන වරද ඉදිරිපත් කර තිබූ නිසා මහේස්ත්‍රාත්තුමා වෙත ඉදිරිපත් කිරීමට උපදෙස් දුන් බවත්ය. ඒ හැර කිසිදු අවස්ථාවක තමා පහරදීමක් නොකළ බවද සඳහන් කර ඇත.

කොමිෂන් සභාව වෙත ලැබී ඇති අධිකරණ වෛද්‍ය වාර්තාවේ ඇති තුවාල සම්බන්ධයෙන් වගඋත්තරකරුගෙන් විමසීමේදී ඔහු ප්‍රකාශ කර ඇත්තේ, පහරදීමක් සිදුකළේ නම්

මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරන අවස්ථාවේදී ඔවුන්ගේ නීතිඥවරුන් මාර්ගයෙන් දැනුම්දීමට හැකියාව තිබුණද කිසිදු අවස්ථාවක එසේ කර නොමැති බවයි. මෙම පැමිණිලිකරු අධිකරණයට හෝ කිසිදු උසස් පොලිස් නිලධාරියෙකුට මේ සම්බන්ධයෙන් පැමිණිලි කර නොමැති බවත්, තවද පොලිසිය භාරයේ සිටින කාලයේදී තමා හෝ වෙනත් නිලධාරියෙක් හෝ පහරදීමක් සිදුනොකල බවත් සඳහන් කරන අතර, මොවුන් තිදෙනා ඇප මත නිදහස් වීමෙන් පසුව ඇතිවූ සිද්ධියක් මත රෝහල් ගතවීමක් සිදුකර ඇත්ද යන්න තමා නොදන්නා බවත් සඳහන් කර ඇත.

**නිරීක්ෂණ :-**

අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව බරපතල නොවන තුවාල දෙකක් ඇති බවත්, එම තුවාල රෝගියා විසින් ඉදිරිපත් කරන ලද කරුණු හා සැසඳෙන බවත් සඳහන් වන බව නිරීක්ෂණය වේ. සාක්ෂි වශයෙන් ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශ දෙකෙහිම ස්ථානාධිපතිවරයා විසින් ඔවුන්ට සහ පැමිණිලිකරුට පහරදුන් බවත්, පැමිණිලිකරුගේ ඔළුවට සහ වම් කණට පහරදුන් බවත්, සඳහන් කර ඇති බවද නිරීක්ෂණය වේ.

මෙම පැමිණිල්ලට අනුව දිවුරුම් ප්‍රකාශ ලබාදී ඇති තැනැත්තන් දෙදෙනාට ද පහරදුන් බවට සඳහන් කරන නමුත්, ඔවුන් ප්‍රතිකාර සඳහා හෝ කොමිෂන් සභාවට පැමිණිලි කිරීම සඳහා ඉදිරිපත් වී නොමැත.

**නිගමනය සහ නිර්දේශය :-**

මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 14 වන වගන්තිය අනුව අතෘප්තියට පත් තැනැත්තෙක් විසින් කොමිෂන් සභාවට කරන ලද පැමිණිල්ලක් මත කොමිෂන් සභාව පනතේ 11 වන වගන්තිය අනුව විමර්ශනය කිරීමෙන් පසුව මානව හිමිකම් උල්ලංඝනය වීමක් අනාවරණය වී ඇත. ඒ අනුව පනතේ 15 වන වගන්තිය අනුව මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වී ඇති බවට හෙළිදරව් වීම මත පහත සඳහන් නිර්දේශයන් ඉදිරිපත් කරනු ලැබේ.

මානව හිමිකම් කොමිෂන් සභා විමර්ශනය අනුව වගඋත්තරකරු විසින් පැමිණිලිකරු කෲර අමානුෂික සහ අවමන් සහගත සැලකිල්ලකට හෝ දඬුවමකට යටත් කර ඇති බැවින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

<u>එන්සලින් ප්‍රනාන්දුට එරෙහිව සරත් පෙරේරා</u> නඩුවේ ශ්‍රී ලංකා නීති වාර්තා 411 අනුව ප්‍රබල සාක්ෂි වලින් සනාථ කරනු ලබන්නේ නම් මිස පොලිසියට එරෙහිව පහරදීම, හිරිහැර කිරීමෙන්

එක් එක් සහ සෑම චෝදනාවක්ම පිළිගනු නොලැබූ නමුත්, පොලිසිය විසින් එය ප්‍රතික්ෂේප කිරීම මතම පමණක් හෝ තුවාල පිළිබඳ වෛද්‍ය සාක්ෂි ඉදිරිපත් කිරීමට අතෘප්තියට පත් පාර්ශවයන්ට නොහැකි වීම නිසාම එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම සුදුසු නොවන බවට දක්වා ඇත.

තවද, මෙම පැමිණිල්ලට අනුව වගඋත්තරකරුවන් පහරදීම ප්‍රතික්ෂේප කළද, අදාළ වෛද්‍ය වාර්තාව අනුව පහරදීමක් සිදුවී ඇති බවට තහවුරු වන බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව අනුව කෲර සහ අවමන් සහගත සැලකිල්ලට හෝ දඬුවමට භාජනය නොකළ යුතුය යන මූලික අයිතිවාසිකම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ලෙස කටයුතු කළ ප්‍රධාන පොලිස් පරීක්ෂක බිමල් රත්නායක යන වගඋත්තරකරු විසින් කඩ කර ඇති බව අනාවරණය වී ඇත. තවද, පොලිස් ස්ථානයක රඳවා සිටින රැඳවියන් සියල්ලන්ගේම මානව හිමිකම් කඩ නොවන ආකාරයට රඳවා තබා ගැනීම ස්ථානාධිපතිවරයාගේ වගකීම ද වේ.

01. ඒ අනුව පැමිණිලිකරු වන ආනන්ද ලාල් වික්‍රම යන අයට වන්දි මුදලක් වශයෙන් රු.15,000/- ක මුදලක් වගඋත්තරකාර ස්ථානාධිපති විසින් ගෙවිය යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

02. තවද, ස්ථානාධිපතිවරයාගේ ක්‍රියාකලාපය පිළිබඳව නිත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා මෙම නිර්දේශයේ පිටපතක් පොලිස්පතිවරයා වෙත යොමු කරනු ලැබේ.

2021.08.19 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ම.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත :- පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

Dr. M.H. Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

B/

Ms. Anusuya Sha
Commissioner
Human Rights Commissioner of Sri Lanka